# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2134/57 – 2019 අගෝස්තු 02 වැනි සිකුරාදා – 2019.08.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 148 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/5/2019/සීර්බී/112.
ප්‍රා. ලේකම්ගේ යොමු අංකය: මහ/ඉ/අත්/සීර්බී/385.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 අගෝස්තු මස 01 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

*උපලේඛනය*

01. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.** – ප්‍රාදේශීය ලේකම්, මහරගම.

02. **ඉඩමේ විස්තරය** – බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 526/බී, ගංගොඩවිල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සහ ගංගොඩවිල (මහරගම නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/එම්එච්ආර්/2019/332 හා 2019.07.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – **මිල්ලගහදෙණිය, මිල්ලගහකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.1161**

උතුරට: පාර සහ රබර්වත්ත පාර; නැගෙනහිරට: රබර්වත්ත පාර; දකුණට: රබර්වත්ත පාරේ වරි. අංක 27ඒ සහ 19/4 දරන ඉඩම්; බටහිරට: වැව්බැම්ම.

08 - 669